# 2026 අප්‍රේල් මාසයට අදාලව 2026.04.21 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2026.04.21
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| 01. වී. සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී. ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10. ඒ. එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## (අ). පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2026.03.19 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත 2026.04.10 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තා මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් ගරු සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ් .එම්. රූපසේන මැතිතුමා විසින් 2026.03.19 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන -**

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

16 පිටුවේ ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීමේදී **සනාථ කගෙන** ලෙස මුද්‍රණය වී ඇති බැවින් එය **සනාථ කරගෙන** ලෙස සංශෝධනය විය යුතු බවත් 17 පිටුවෙහි ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමියගේ අදහස් දැක්වීමේදී **පුද්ගලකු** ලෙස මුද්‍රණය වී ඇති බැවින් එය **පුද්ගලයෙකු** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

19 වැනි පිටුවෙහි ගරු එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීමේදී **අඩි 03ක් පිටුපසට ගෙන ඉදි කරන ලෙස එවකට ප්‍රාදේශීය සභාවේ සභාපති ,සභා ලේකම්, කේ.ලීබට් මහතා කොන්ත්‍රාත්කරු , මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු යන අය** ලෙස සටහන්ව තිබීම **අඩි 03ක් පිටුපසට ගෙන ඉදි කරන ලෙස එවකට ප්‍රාදේශීය සභාවේ සභාපති ,ප්‍රාදේශීය ලේකම්, කේ.ර්බට් මහතා කොන්ත්‍රාත්කරු , මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු යන අය** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා**

පිටු අංක 16 හි ගරු **මන්ත්‍රී ඒ.එම්.** ජානක නාමල් **බණ්ඩාර** මැතිතුමා ලෙස මුද්‍රණය වී තිබීම **නිමල්** ලෙස සංශෝධනය විය යුතු බව පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා සංශෝධන සහිත 2026.03.19 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.03.19 දින පවත්වන ලද සංශෝධිත වාර්තාව සභා සම්මත විය.

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

### (ආ).01. වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණය - 2026

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.04.10 දින දක්වා වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01.2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 199,800.00 |
| 02.2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 165,680.00 |
| 03.2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 314,800.00 |
| 04.2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 370,880.00 |
| | රු. 1,051,160.00 |

ගාස්තු අය කිරීම සඳහා ව්‍යාපාරික ස්ථාන 524 ක් හඳුනා ගෙන ඇති අතර අදාළ ගස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

### (ආ).02. වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණය - 2026

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.04.10 දින දක්වා වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01.2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 223,950.00 |
| 02.2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 235,400.00 |
| 03.2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 383,500.00 |
| 04.2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 315,000.00 |
| | රු.1,157,850.00 |

අදාළ ගස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

පෙ.ව. 9.40 ට ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමිය සභා ගර්භයට පිවිසියාය.

පෙ.ව. 9.45 ට ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා සභා ගර්භයට පිවිසියේය.

**(ඈ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

**(ඈ).යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

**(ඉ).යථාපරිදි කල්දි ඇති යෝජනා.**

**(ඉ).01.ගරු මූලාසනයේ යෝජනා.**

**(ඉ).01.01. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ඇදිරි නීති පැනවූ දිනවල අය කර ගැනිමට නොහැකි වූ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ලේඛන වලින් ඉවත් කිරීම සම්බන්ධවයි.**

කොවිඩ් 19 වසංගත තත්වය පැවැති 2020, 2021 සහ 2022 යන වර්ෂවල බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 12 ක් සඳහා ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.191250.00 ක හිග ශේෂයක් පැවැති අතර ඉන් රු.67200.00 ක ගාස්තුවක් 2025.12.31 දිනට පෙර අයකර ගන්නා ලදී.

ඒ අනුව, තවදුරටත් 2020 සහ 2021 වර්ෂයේ හිඟ මුදලෙන් රු.111150.00 ක ගාස්තුව සහ 2022 වර්ෂයෙන් රු.12900.00 ක ගාස්තුවක් දැනට හිඟ වශයෙන් පවතින අතර එයින්ද 2022 වර්ෂයේ හිඟ ගාස්තුව අයකර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

නමුත්, කොවිඩ් 19 වසංගතය පැවැති සමයේ 2020 සහ 2021 වර්ෂවල ව්‍යාපාරික ස්ථාන වසා තැබීම හේතුවෙන් අයකර ගැනිමට නොහැකි වූ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු සම්බන්ධයෙන් 2022,2023 සහ 2024 යන වර්ෂවල දී එම ව්‍යාපාරික ස්ථාන දැනුවත් කරන ලදී. නමුත්, දැන්වීම් පුවරු සවිකරන ලද ආයතන සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොමැති බැවින් සහ ඇතැම් ව්‍යාපාරික ස්ථාන වසා ඇති බැවින් තව දුරටත් එම හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කර ගැනීම ගැටළුවක් ව ඇත.

ඒ අනුව, ඉහත වර්ෂවල හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු රු.111150.00 ක ගාස්තු ලේඛන වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

කොවිඩ් 19 වසංගතය පැවැති සමයේ 2020 සහ 2021 වර්ෂවල ව්‍යාපාරික ස්ථාන වසා තැබීම හේතුවෙන් අයකර ගැනිමට නොහැකි වූ හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.111,150.00 ක මුදල ලේඛන වලින් ඉවත් කිරීමට සහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>(ඉ).01.02. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.</u>**

2026.03.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවේ ජල යෝජනා ක්‍රමවල මාසික ජල බිල්පත් ලබාගැනීම අවශ්‍ය කඩදාසි රෝල් 120 ක් මෙම වර්ෂය සඳහා ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

2. බිබිල ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර වල ගමන් කරන කම්කරුවන් හට රක්ෂණාවරණයක් නොමැති බැවින් පහත නම් සඳහන් වාහන සහ යන්ත්‍රසූත්‍ර වල ගමන් කරන තාවකාලික/ආදේශක/අනියම් කම්කරුවන් සඳහා 2026 වර්ෂයට රක්ෂණාවරණයක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම .

| අ.අ. | නම |
|---|---|
| 01 | ආර්.එම්.ගුණපාල |
| 02 | ඩී.එම්.සිරිල් දිසානායක |
| 03 | ප්‍රවීන් රංගන |
| 04 | ඒ.එම්.හරිස්චන්ද්‍ර |
| 05 | ඒ.එම්.ධනුෂ්ක සංධීර |
| 06 | එල්.ඒ.බී.මිලිඳු සම්පත් |
| 07 | ඩබ්.එම්.පූර්ණ ලක්ෂාන් |
| 08 | පී.එම්.ඉන්දික ප්‍රසාද් |
| 09 | එස්.මංජුල සමන් කුමාර |
| 10 | කේ.එම්.සරත් පියසෝම |
| 11 | ඩී.එම්.රෝහිත දිසානායක |

3. බිබිල රදළියද්ද ආදාහනාගාරය මේ වන විට මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා බල ප්‍රදේශය තුළ රු.12,500.00 ක්ද බල ප්‍රදේශයෙන් පිටත රු.13,500.00 ක් ලෙස අය කරනු ලබන අතර රටේ පවතින ඉන්ධන මිල ඉහළ යාමත්, ගෑස් මිල ඉහළ යාමත්, අලුත්වැඩියා ගාස්තුව අධික වීමත් අනුව මෘත දේහ ආදාහන ගාස්තු සංශෝධනය කිරීම.
4. "බිබිල ප්‍රාදේශීය සභාව" නමින් හැඳින්වෙන නාම පුවරුව ප්‍රසම්පාදනය කර අළුත්වැඩියා කිරීම.

5. PF 7391 කැබ් රථයේ සිදුකළ යුතු පහත අළුත්වැඩියාවන් සඳහා සුදුසු ගරාජයක් තෝරාගෙන අළුත්වැඩියා කිරීම.
   - ඉන්ධන මීටරය ක්‍රියා නොකිරීම
   - පිටුපස ඩිකියේ SHOCKET SOBER අක්‍රීය වීම
   - WIPER BLADE SET ක්‍රියා නොකිරීම
   - A/C පද්ධතිය නිසි ලෙස ක්‍රියා නොකිරීම
   - TIE ROD END
   - RACK END
   - RACK MOUNT

6. 252-6355 රථයේ සිදුකළ යුතු පහත අළුත්වැඩියාවන් සඳහා සුදුසු ගරාජයක් තෝරාගෙන අළුත්වැඩියා කිරීම.

   - LHS OUTER CV ASSY
   - FRONT LHS/RHS SIGNAL LIGHT ASSY
   - POWER STEERING PRESSURE HOSE

7. ඵලදායිතා සංකල්පය යටතේ ආදායම් හා ගිණුම් අංශය සඳහා යතුරු පුවරු 02ක් රු.15,000.00 සීමාව යටතේ මිල දී ගැනීම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ අංක 01, 04, 05, 06, 07 යන නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, **නිර්දේශ අංක 02** මගින් නිර්දේශ කර ඇති වාහන හා යන්ත්‍රසූත්‍ර වල ගමන් කරන තාවකාලික, ආදේශක , අනියම්, කම්කරුවන් සඳහා පමණක් නොව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු සියලුම තාවකාලික, ආදේශක , අනියම්, කම්කරුවන් සඳහා රක්ෂණාවරණයක් ලබාදීම සඳහා සියලුම නීතිමය තත්වයන් පිළිබඳව හා ඒ අය සඳහා ලබාදෙන රක්ෂණාවරණයට සභා අරමුදලින් ගෙවීම් කරනු ලබන්නේද , සේවක වැටුපෙන් ගෙවීම් කරනු ලබන්නේද , එසේ නැතිනම් සභා අරමුදලින් හා සේවක වැටුපෙන් යන

දෙපාර්ශවයම එක්ව ගෙවීම් කරනු ලබන්නේ ද යන්න පිළිබඳව වාර්තාවක් සකස් කර මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට නැවත ඉදිරිපත් කර ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කිරීමටත්, **නිර්දේශ අංක 03** මගින් ඉදිරිපත් කර ඇති බිබිල රදලියද්ද ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීම සඳහා අයකරනු ලබන මිල සංශෝධනය කිරීමේ නිර්දේශයට අනුව බල ප්‍රදේශය තුළ මෘතදේහ ආදාහනය කිරීම සඳහා මේ වනවිට අය කරනු ලබන රු.12500.00 ක මුදල රු.15500.00 දක්වා ඉහළ නැංවීමටත් ප්‍රදේශයෙන් පිටත මෘතදේහ ආදාහනය කිරීම සඳහා දැනට අය කරනු ලබන රු.13500.00ක මුදල රු.16500.00 දක්වා ඉහළ නැංවීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.03. බිබිල ප්‍රාදේශිය සභා පෙර පාසලේ ළමුන්ගෙන් ප්‍රාදේශිය සභාවට අය කර ගනු ලබන 10% ක මුදල සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභා පෙර පාසල් ළමුන්ගෙන් අය කර ගන්නා මාසික මුදලින් 10%ක් 2025 වර්ෂයේ සිට කමිටු තීරණයක් අනුව පෙර පාසලේ නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශිය සභාව වෙත අය කර ගනු ලැබේ.

එහෙත් මිල කමිටු තීරණයට අනුව දෙමාපිය හමුවක් කැඳවා සාකච්ජාවක් කරන ලෙස නිර්දේශ විය. ඒ අනුව දෙමාපිය හමුවේදි සාකච්ජා වූ පරිදි පෙර පාසල් ළමුන්ගෙන් අය කර ගන්නා ලද මුදලින් 10%ක මුදලද නැවත එම ස්වෙච්ඡා ගුරුවරු අතර බෙදා දීමට සුදුසු බව තීරණය විය. ඒ පිළිබඳ සභා අනුමැතිය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන පෙර පාසල් කීයක් තිබේදැයි ගරු මූලාසනයෙන් විමසා සිටින ලදී.

<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>

ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් වලින් ළමුන්ගෙන් අයකර ගන්නා මාසික ගාස්තුවෙන් 10%ක් 2025 වර්ෂයේ සිට බිබිල ප්‍රාදේශීය සභාවට නඩත්තු වියදම් ලෙස අයකරන ලදී. නමුත් පෙර පාසල් ගුරු භවතුන් පෙර පාසල් ගාස්තු වැඩි කරන ලෙස ඉල්ලීම් කළ බැවින් දරුවන්ගෙන් අයකරන මුදල වැඩි නොකර සභාවට අය කළ 10% ක මුදල පෙර පාසල් ස්වෙච්ඡා ගුරුවරුන් අතරේ බෙදාදීමට තීරණය කළ බවයි. එසේ තිබියදී පෙර පාසලේ දෙමව්පිය හමුවේදී දෙමව්පියන්ගේ එකඟතාවයෙන් රු.200.00ක ගාස්තුවක් මාසිකව වැඩි කර මාසික ගාස්තුව රු.1200.00 ක් ලෙස අය කිරීමට තීරණය කරගත් බවත් පැවසීය. දෙමව්පියන්ට විශාල මුදලක් ගෙවීම් කිරීමට නොහැකි බැවින් සභාවට මාසිකව ලබා ගන්නා නඩත්තු වියදම ලෙස අයකරනු ලබන 10% ක මුදල අය නොකර එම මුදලද ස්වෙච්ඡා ගුරුවරුන් අතරේ බෙදා දීමට තීරණය කළ බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා පෙ.ව.10.45 ට සභා ගර්භයට පැමිණෙන ලදී.

## (ඉ).01.04. මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිම සම්බන්ධවයි.

උක්ත කරුණ සම්බන්ධව ලංකා සතොස, බිබිල කළමනාකරු වන එම්.ජී.ඩී.ජී. අබය ගුණවර්ධන මහතා විසින් 2025.05.26 දිනැතිව ඉදිරිපත් කර ඇති ඉල්ලිම් ලිපිය මඟින් බිබිල සතොස අලෙවිසැලේ මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරිමට සැලසුම් සකස් කරමින් සිටින බවත්, බිබිල සතොස අලෙවිසැලට මත්පැන් අලෙවිකිරිමට අවස්ථාවක් ලබා ගැනිම සඳහා මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිමට අවශ්‍ය සහය ලබා දී ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලිම් කර ඇත.

ඒ අනුව සතොස කළමනාකරු විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනිමට ගරු මහ සභාවට කාරුණිකව ඉදිරිපත් කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාවෙහි මේ වනවිට සතොස ගොඩනැගිල්ල ලබාදී ඇත්තේ මත්පැන් අලෙවි කිරීමට නොව අනෙකුත් පාරිභෝගික භාණ්ඩ අලෙවි කිරීම සඳහා බැවින් මත්පැන් අලෙවියට මෙම ගොඩනැගිල්ලේ අවසරය ලබාදීමට මුදලක් අයකිරීම සුදුසු බව පැවසීය. එසේ මුදලක් අයකර ගැනීමට නොහැකි නම් නව තක්සේරුවක් සිදුකර ගාස්තු අය කිරීම සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය</u>

බිබිල නගරයේ මත්පැන් අලෙවිසැල් පවත්වා ගෙන යනු ලබන්නේ ද්‍රවිඩ ජාතිකයින් බැවින් සිංහල අයෙකුට මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදීම සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා</u>

ලෝකයේ විවිධ රටවල සෑම අලෙවි සැලකින්ම මත්පැන් මිලදී ගැනීමට අවස්ථාව තිබෙන බැවින් ලංකාවේද මෙම තත්වය ඇතිවීම සුදුසු බවත් මෙම ගොඩනැගිල්ලෙහි මත්පැන් අලෙවිය සිදුකිරීමට අවසරය ලබා දෙන්නේ නම් බදු කුලිය වැඩිකර හෝ වෙනත් මොනයම් හෝ ආකාරයකින් මුදලක් අය කළයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට තමා පෞද්ගලිකව අකමැති බවත් නීත්‍යානුකූලව මත්පැන් අලෙවි කිරීමේ ස්ථාන පවතින බැවින් මෙවැනි ස්ථානයක මත්පැන් අලෙවියට එකගතාවය ලබා දුනහොත් සභාවට අප්‍රසාදයක් ඇතිවනු ඇතැයි පැවසීය. දුප්පත් ජනයාට ලබා දෙන අස්වැසුම ලබා ගෙන පැමිණෙන්නේ මෙම සතොස අලෙවි සැලට බවත් එසේ පැමිණෙන පුද්ගලයින් පහසුවෙන්ම මෙම ස්ථානයේ මත්පැන් රැගෙන යාමට පෙළඹෙනු ඇතැයි පැවසීය. මත්පැන් අලෙවිසැලක් වන විට දැනට

අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ වර්ගවලට වඩා මේ මගින් විශාල ආදායමක් සතොසට ලබා ගැනීමට හැකිවන බැවින් මෙමගින් විශාල කුලියක් අය කිරීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා**

මෙම යෝජනාව මීට පෙර පැවති සභාවක් වෙතද ඉදිරිපත් වූ බවත් ගරු මූලාසනය පැවසූ ආකාරයට එකම ගොඩනැගිල්ලේ එකම වර්ග අඩි ප්‍රමාණයක් තුළ මෙම මත්පැන් අලෙවිසැල ආරම්භ කළද මෙය ආදායම් මාර්ග දෙකක් බවත් මත්පැන් අලෙවියෙන් විශාල ආදායමක් උත්පාදනය කිරීමට හැකිවන බවත් මෙමගින් සිල්ලර බඩු වෙළදාම ද ඉහළ යන බවත් පැවසීය. පෞද්ගලිකව මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට තමා අකමැති බවත් පැවසූ අතර එපමණක් නොව ප්‍රාදේශීය සභා අනුමැතිය ලැබී ඇති බැවින් පාරිභෝගිකයින් තුළ විශ්වාසය වැඩිවන බැවින් සතොස කළමණාකරන තුමාට සභාවට ගෙවීමට හැකි මුදල පිළිබඳව විමසා සිටීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා**

මත්පැන් අලෙවි සැලක් මගින් විශාල ආදායමක් උත්පාදනය කළහැකි නිසා මෙම ගොඩනැගිල්ල මත්පැන් අලෙවියට සුදුසු ලෙස සකස් කර සභාව විසින් මෙය පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන්නේ නම් සුදුසු බව පැවසීය.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

තක්සේරු කර ලබා දී ඇති මෙම ගොඩනැගිල්ලෙහි මත්පැන් අලෙවි කිරීමට අවසරයක් සතොස කළමණාකාරතුමා විසින් ඉල්ලුම් කර ඇති බවත් මෙතෙක් මෙම ගොඩනැගිල්ලෙහි නොවිකුණූ භාණ්ඩයක් බැවින් මේ සඳහා මුදලක් අයකළ යුතු බවත් තක්සේරු කර කුලිය වැඩි කිරීමට දිගු කාලයක් ගත වන බැවින් ඊළඟ වර්ෂයේදී තක්සේරු කරන තෙක් දෛනිකව සභාවට මුදලක් ලබාදීමට එකඟතාවයක් ලබා ගැනීම සුදුසු බව පැවසීය. දිනකට කොතරම් මුදලක් අය කරන්නේ දැයි ගරු සභාව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව පැවසීය.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කොන්දේසි කිහිපයක් ඉදිරිපත් කර ඇති බවත් ඒ තුළ පන්සල් ,පාසල් , අධිකරණ ස්ථානවල සිට මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට නිශ්චිත දුරක් දක්වා ඇති බැවින් බිබිල ප්‍රාදේශීය සභාව මේ සඳහා අවසරය ලබා දුන්නද එම නීතිමය පදනමට අනුව කටයුතු කළයුතු බව පැවසීය. මෙම අලෙවිසැල ආරම්භ කිරීම සම්බන්ධයෙන් සභාවේ අනුමැතිය ලබාදීමට පෙර නීතිමය පසුබිම පිළිබඳ තවත් අවබෝධය ලබා ගතයුතු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

මෙම යෝජනාව පිළිබඳ තීරණයක් ලබා ගැනීමට ඉදිරි මහ සභාවට කල් තබන ලදී.

## **(ඉ).01.05. 2025/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කළ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ 23ක් පහත පරිදි ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට සහා අනුමැතිය ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල මහජන පුස්තකාල වාහන හා යන්ත්‍රෝපකරණ ලේඛණයේ පිටු අංක 62හි Dell Monitor 14 ක් ලෙස සඳහන්ව තිබුණද එහි භෞතිකව නිරීක්ෂණය වූයේ Dell Monitor 6 ක් හා HP වර්ගයේ All in one computer 8 ක්ද තිබෙන බවයි. ඒ අනුව මෙම ලේඛණය Dell Monitor 6 ක් හා All in one computer (HP) 8 ක් ලෙස වෙන් වෙන්ව ඇතුලත් කල යුතුය.

2. බිබිල මහජන පුස්තකාල වාහන හා යන්ත්‍රෝපකරණ ලේඛණයේ පිටු අංක 65හි Epson printer 1ක් ලෙස සඳහන්ව තිබුනද එය 2023 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කර ඇත. ඒ අනුව එය පොත් වලින් ඉවත්විය යුතු අතර HP Desk Jet Printer (all in one) 01 ක් ලෙස නව ප්‍රින්ටරයක් ඇතුලත් කල යුතුවේ.

3. පුවක්පැලේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ ආයුධ හා සුළු උපකරණ ලේඛණයේ පිටු අංක 88 හි ඇතුලත් 6*3 ඇස්බැස්ටෝස් තහඩු 32 යන අයිතමය අමානෝ තහඩු 32ක් ලෙස වෙනස් විය යුතු වේ.

4. පුවක්පැලේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානය සඳහා ලබාගෙන ඇති විල්බැරෝව 2022/03/07 දින දර්ශන හාඩ්වෙයාර් වෙතින් මිලදී ගෙන ඇති එකක් වන අතර භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් වූ විල් බැරෝව ඉතාමත් අබලන් තත්වයේ එකක් විය. (පාවිච්චියට ගත නොහැකි මට්ටමට) මෙය අසාමාන්‍ය අබලි තත්වයකට පත්වීමක් ලෙස නිරීක්ෂණය වන බැවින් වත්කම් හා යන්ත්‍රෝපකරණ භාවිතයේදී ඒවායේ ආරක්ෂාව සම්බන්ධව මීට වඩා වැඩි අවධානයක් යොමු කල යුතු වන බව පෙන්වා දෙන්නෙමු.

5. බිබිල මහජන පුස්තකාල පාරිභෝගික භාණ්ඩ ලේඛණයේ 64 පිටුවෙහි සඳහන් 6405 Widows 7 (pro) යනු පරිගණක මෘදුකාංගයකි. මෙය දැන් කල් ඉකුත්වී ඇති බැවින් පොත් වලින් ඉවත් කිරීම සුදුසු වේ.

6. බිබිල මහජන පුස්තකාලයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛණයේ 62 පිටුවෙහි ඇති Laptop HP 4 ක් ලෙස සඳහන් වුවද සත්‍ය වශයෙන්ම ඇත්තේ HP වර්ගයේ Laptop 1 ක් සහ අනෙක් Laptop 3 Lenovo IdeaPad 130 Notebook වර්ගයේ ඒවා වේ. එබැවින් මෙම අයිතම වෙන වෙන වෙනම පොත් වල ඇතුලත් කල යුතුවේ.

7. බිබිල ප්‍රාදේශීය සභා ඉන්වෙන්ට්‍රි ලේඛණයේ ඇති 1000 L ප්ලාස්ටික් ජල ටැංකි 7ක් ලෙස සඳහන්ව තිබුණද ඉන් 5 ක් ඇත්තේ ප්‍රාදේශීය සභා නිල නිවාස වලය ඒවා අදාල නිල නිවාස පොත් වලට ඇතුලත් කිරීම සුදුසු වේ.

8. බිබිල ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතියට අදාල තොග අයිතම ගබඩා කර ඇති ජල ගබඩාව නිසි පිළිවෙලකට වර්ග කර ගබඩා කර නොතිබීම නිසා ගබඩා අයිතම සමීක්ෂණය කිරීම වැඩි කාලයක් ගතවීම සහ සමීක්ෂණය අපහසු මට්ටමේ පවතී. එම ගබඩාවේ අයිතම වෙන් වෙන්ව වර්ග කර අසුරා තැබීම කල යුතුවේ.

9. එමෙන්ම කාර්යාලය සඳහාද ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති කම නිසා භාණ්ඩ තැන් තැන්වල දමා ඇති තත්වයක් නිරීක්ෂණය විය. මෙසේ තිබීම මත ගබඩා අයිතම වල කල්පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධ ගැටළු මතුවිය හැකි බැවින් විධිමත් ගබඩාකරණ ක්‍රමවේදයක් සකස්කර ගැනීම සුදුසු වේ.

10. ආයුධ හා සුළු උපකරණ සමීක්ෂණයේදී සමීක්ෂණයට ඉදිරිපත් වූ අයිතම ඉතා පැරණි සහ අබලන් තත්වයේ ඒවා විය. මෙම උපකරණ සත්‍ය වශයෙන්ම ප්‍රාදේශීය සභාවේ අයිතමද යන්න නිශ්චිතවම

හඳුනා ගැනීම අපහසුය. එබැවින් ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ නියමිත පරිදි හඳුනා ගැනීම සඳහා ඒවායේ හඳුනා ගැනීමේ ලාංඡනයක් යෙදීම සුදුසුවේ. එසේ නොවුවහොත් යම් අක්‍රමිකතා සිදුවීමේ වැඩි අවධානමක් පවතී.

10. බොහෝ කර්මාන්ත නිම කිරීමෙන් අනතුරුව ඒවා ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කිරීමට ප්‍රමාදයක් පවතින අවස්ථා නිරීක්ෂණය විය. එබැවින් යම් කර්මාන්තයක් නිමවූ වහාම ඒවාට අදාල අයිතම ඉන්වෙන්ට්‍රිගත කිරීම සිදු කල යුතුවේ.

11. බිබිල ප්‍රාදේශීය සභා සංස්කෘතික මධ්‍යස්ථානයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛණයේ ඇති පිටු අංක 92 සිට 93 ට අදාල සෙල්ලම් උපකරණ තොගය මේවන විට ගලවා ඉවත් කර ප්‍රාදේශීය සභා නිල නිවාස පරිශ්‍රයේ ගොඩ ගසා ඇත. මේවා සුළු අළුත්වැඩියාවක් කර සෙල්ලම් උපකරණ අත්‍යාවශ්‍ය ඒකක වලට (පෙර පාසැල් ආදී) ලබා දීමට කටයුතු කිරීම යෝග්‍ය වේ.

12. බිබිල ප්‍රාදේශීය සභා ලී බඩු හා සවි කිරීම් ලේඛණයේ පිටු අංක 35 හි ඇති ප්ලාස්ටික් වතුර ටැංකි 2න් 1ක් ආයුර්වේදය පරිශ්‍රයේ ඇති බැවින් එය ආයුර්වේදයේ පොත් වලට ඇතුලත් කිරීම සුදුසු වේ.

13. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඒකක වලට (ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථාන / පෙර පාසැල් /නිල නිවාස/මහජන පුස්තකාල ආදී) ලබා දී ඇති බඩු අදාල ඒකකයේ ඉන්වෙන්ට්‍රි තුළම ඇතුලත් කිරීමට කටයුතු කිරීම සුදුසු වේ.

14. ජල ගබඩාව තුල ගොඩගසා ඇති ඉවත් කරන ලද පරණ ජල මීටර් තොගය, ගබඩාව ඉදිරිපස ගොඩගසා ඇති නල ලිං අබලි තොගය හා ට්‍රැක්ටර් රිම් තොගය හඳුනාගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම සුදුසු වේ.

15. බිබිල මහජන පුස්තකාල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛණයේ පිටු අංක 62 හි Techcin power (UPS) 650V 15 ලෙස සඳහන් වුවද එම UPS වල නම DCP ලෙස වෙනස් විය යුතුවේ.

16. බිබිල ප්‍රාදේශීය සභා ආයුධ හා සුළු උපකරණ ලේඛණයේ පිටු අංක 1 හි ඇති HP Scanjet-200 අයිතම 2 ඡායා පිටපත් යන්ත්‍ර (Scanner) 2 ක් වන බැවින් ඒවා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛණයට ඇතුලත් කල යුතුවේ.

17. භාණ්ඩ හඳුනා ගත හැකිවීමේ පහසුව සඳහා සියළු භාණ්ඩ අංකනය කිරීමට කටයුතු කිරීම.

18. සුළු වටිනාකමක් සහ සුළු කල්පැවැත්මක් ඇති භාණ්ඩ අයිතම ඉන්වෙන්ට්‍රි ලේඛණ වලින් ඉවත් කොට පාරිභෝගික භාණ්ඩ ලේඛණයට ඇතුලත් කිරීම සුදුසු වේ.

19. එදිනෙදා වැඩ කටයුතු වලට අවශ්‍ය ආයුධ හා උපකරණ සේවකයන්ට නිකුත් කිරීමේදී වැඩ පරිපාලක මහතකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒවා නිකුත් කිරීම හා භාර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයකට සකස් කිරීම අවශ්‍ය වේ.

20. කාර්යාල පරිශ්‍රයේ හා ගබඩා වල අවිධිමත් අයුරින් ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය විධිමත් ආකාරයෙන් අපහරණය කිරීමට කටයුතු කිරීම.

21. වාහන අංගනයෙ දිරාපත් වෙමින් පවතින අත් ට්‍රැක්ටර් ට්‍රේලරය හා ට්‍රැක්ටර් ට්‍රේලරය අපහරණය සඳහා යාන්ත්‍රික අධ්‍යක්ෂගේ නිර්දේශ මත කටයුතු කිරීම සුදුසු වේ.

22. වාහන අංගනයේ දිරාපත් වෙමින් පවතින ලොතරැයි කූඩු හා ජංගම කූඩු මෙන්ම අනෙකුත් අබලි ද්‍රව්‍ය හඳුනාගෙන වෙන්දේසි කිරීම යෝග්‍ය වේ.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.අසංක වාසළ මැතිතුමා

මෙහි අංක 22 මගින් දක්වා ඇති වාහන අංගනයේ දිරාපත් වෙමින් පවතින අත් ට්‍රැක්ටර් ට්‍රේලරය හා ට්‍රැක්ටර් ට්‍රේලරය අපහරණය කිරීම සඳහා යාන්ත්‍රික අධ්‍යක්ෂගේ නිර්දේශය මත කටයුතු කිරීම සුදුසු බව දක්වා තිබුණද මීට පෙර පැවති මහ සභාවකදී මේ පිළිබඳ සාකච්ඡා කර මන්ත්‍රී මණ්ඩලයේ තිදෙනෙකු පරීක්ෂා කර බැලීමට තීරණය කළ බවත් තමාද එම කමිටුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙකු බවත් එහිදී මන්ත්‍රීවරුන් අත් ට්‍රැක්ටර් ට්‍රේලරය අපහරණය කිරීමටත් ට්‍රැක්ටර් ට්‍රේලරය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් පරීක්ෂා කර තීරණය කළද එය නැවත මය සභාවට ඉදිරිපත් නොකළ බව පැවසීය.

ජංගම වෙළඳකුටි හා ලොතරැයි කූඩු ප්‍රාදේශීය සභාව මගින් සභාව වෙත රැගෙන ආ පසු ඒවා දිගුකාලීනව අයිතිකරුවන් සිටී යැයි පවසමින් තබා නොගෙන කිසියම් කාලසීමාවක් ඇතුළත ඒවායෙහි ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට රැගෙන නොයන්නේ නම් ව්‍යාපාර ආරම්භ කිරීමට කැමති පුද්ගලයින් හට ලබාදීමට කටයුතු කිරීමට සුදුසු බවත් වෙළඳ ප්‍රචාරක දැන්වීම් නගරය පුරා පවතින බවත් ඒවායින් අයකිරීම් කටයුතු සිදු නොකරන බැවින් ආදායම් පරීක්ෂක මහතාගේ යම් යම් අඩු පාඩු තිබෙන බවත් එබැවින් සභාවේ ආදායම් අයකර ගැනීම් කටයුතු හැකි ඉක්මණින් සිදු කළයුතු බවත් පැවසීය.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

අනෙකුත් ආයතනවලට සාපේක්ෂව ප්‍රාදේශීය සභාවක භාණ්ඩ සමීක්ෂණය කිරීම , භාණ්ඩ සමීක්ෂණය කරනු ලබන නිළධාරි මණ්ඩලයට ඉතා අපහසු කාර්යයක් බවත් එබැවින් එම මණ්ඩලයේ පහසුව උදෙසා සමහර නිර්දේශ ඉදිරිපත් කර ඇති බවත් සමහර නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි නිර්දේශ බවත් පැවසීය.

මෙම නිර්දේශ මගින් පුස්තකාල , නිළ නිවාස ආදී ලෙස එක් එක් අංශ මට්ටමින් ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම යෝජනා කර තිබුණද තමා සිතනු ලබන්නේ මෙම භාණ්ඩ බිබිල ප්‍රාදේශීය සභාවේ පොදු ඉන්වෙන්ට්‍රියකට ඇතුළත් කර විවිධ අංශ වෙත බෙදාහැර ඇති බව ලේඛන ගත විය යුතු බවත් පොදු ඉන්වෙන්ට්‍රියේ සටහන් කර ලබාදුන් අංශය මගින් අංශ ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන යාම සුදුසු බවයි.

එසේම අබලි ද්‍රව්‍ය ක්ෂය වී ඇති භාණ්ඩ වෙන්දේසි කිරීමට වඩා අලුත්වැඩියා කර භාවිතයට ගතහැකි දේවල් අලුත්වැඩියා කර ජනතා සේවයට යෙදවීම සුදුසු බව පැවසූ අතර ඒ සඳහා උදාහරණ ලෙස පෙර පාසල මගින් ඉවත් කළ උපකරණ අලුත්වැඩියා කර අනෙකුත් පෙරපාසල් වෙත බෙදා හැරීම දිරාපත් වෙමින පවතින ජංගම කූඩු ලොතරැයි කූඩු අලුත්වැඩියා කර ජංගම වෙළඳ රථ ලෙස පොදු ජනතාවට ලබාදීම සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා

පුස්තකාලයේ ,පෙර පාසලේ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ මෙන්ම ඉන්වෙන්ට්‍රිගත නොවන භාණ්ඩ රාශියක් පවතින බවත් එබැවින් එම භාණ්ඩ නිවැරදිව ඉන්වෙන්ට්‍රිගත වූයේ නම් සුදුසු බවත් එසේ හඳුනා නොගතහොත් එම සමහර භාණ්ඩ දිරාපත්වී විනාශ වීමට අස්ථානගත වීමට හැකියාවක් පවතින බව පැවසීය.

<u>උප සභාපති එච්.එම්. අනුරසිර ගුණසේකර මැතිතමා</u>

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා පැවසූ ආකාරයට ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ නිවැරදිව ඉන්වෙන්ට්‍රිගත වියයුතු බව පැවසීය. මේ සඳහා පරිපාලනය මැදිහත් වියයුතු බවත් පොදුවේ පරිපාලනයේ දුර්වලතා පවතින බව පැවසීය. මුදල් සම්බන්ධ එකතුවීම් , මුදල් සම්බන්ධ නිර්දේශ , මුදල් සැලසුම්, කොතරම් කාලයක් තුළ ඇතුළත් කර ගන්නවාද, නඩත්තු අංශය සඳහා යොදා ගන්නවාද, යන සියල්ල විධිමත් පරිපාලන ව්‍යුහයක ඇතුළත් වියයුතු බව පැවසීය. එසේ නැතිවුවහොත් ගැටලුකාරී තත්වයන් ඇතිවිය හැකි බව පැවසීය.

ආදායම් අංශයේ වෙළඳ බලපත්‍ර ලබාගෙන ඇති හා නැති ලෙස කණ්ඩායම් සිටින බවත් එබැවින් මේවා නිවැරදිව හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සති දෙකකට වරක් වත් කැඳවීම් කර ඒ අයගෙන් ඒ පිළිබඳව තොරතුරු ලබාගෙන ඉදිරිපත් කළයුතු බව පැවසීය. සභාවේදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක නොකරන බැවින් ඒ පිළිබඳව ද සමාලෝචනය කර නැවත සභාව දැනුවත් කළයුතු බවත් එසේ නැතිනම් මෙම වාර්තා කොළගොඩක් පමණක් බවත් පැවසීය.

එබැවින් පරිපාලනය විධිමත් වියයුතු බවත් ආයතනය ඔහේ පවත්වාගෙන යන්නේ නම් සභාවේ මන්ත්‍රී මණ්ඩලයක් නොසිටිය යුතු බව පැවසීය.විධිමත්ව කාර්ය කළමණාකරනය කරගෙන ආයතනය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය තමා තුළ දැඩිව පවතින බව පැවසීය. මුරකරුවන්ගේ සිට කාර්ය මණ්ඩලය පාලනය කළයුතු බවත් සේවයට වාර්තා නොකළහොත් ආයතනයට පැමිණ අත්සන් කර සේවයේ නොයෙදුණහොත් නීතිය ක්‍රියාත්මක කළයුතු බවත් ආයතනය තුළ කතා කිරීමට නොදන්නා පිරිසක් සිටින බවත් ආයතනයේ කිසිම පිරිසිදුකමක් නොමැති බවත් එවන් අවස්ථාවල පරිපාලනය ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකළයුතු බවත් පැවසීය. රජයේ සේවයේ යෙදෙන නිළධාරීන් හා සේවක මහතුන් සඳහා නීති අනපනත් වලට අනුව නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කළයුතු බවත් එසේ නොකළහොත් සභාවේ කාර්ය මණ්ඩලය අත්තනෝමතිකව ක්‍රියා කිරීමට පෙළඹෙන බැවින් පරිපාලනය විසින් විධිමත් පාලනයක් කළයුතු බව පැවසීය.

රජයේ ආදායම් එකතු කිරීම පාලනය කිරීම, PL කාණ්ඩයේ සේවකයින් නිරීක්ෂණය කිරීම පාලනය කිරීම ආදිය පරිපාලනය විසින් සිදුකළයුතු අතර ඒ අය නිවැරදිව නිවාඩු අනුමත කර නොගන්නේ නම් ඒ අය සඳහා නීතිය ක්‍රියාත්මක කළයුතු බව හා විනය ක්‍රියාමාර්ග ගැනීම සිදු කළයුතු බව පැවසීය. එසේ නොකළහොත් මෙම ආයතනය පාලනය කළ නොහැකිබවත් මෙම ආයතනයේ සේවකයින් නිවැරදිව පාලනය කළයුතු බව කණගාටුවෙන් වුවද තමා පවසන බවත් එසේ නිවැරදිව පාලනය නොකළහොත් සභාවේ තීරණයක් ගෙන පළාත් පාලන කොමසාරිස් වෙත ගොස් විධිමත් ක්‍රියාමාර්ග ලබා ගන්නා බව පැවසීය.

මාසයකට වරක් සභා ලේකම් , කාර්මික නිළධාරි, ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි එක්ව ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීම සිදුකළයුතු බවත් , සභා ලේකම්ගේ අණ නොතකා කාර්ය මණ්ඩලය ක්‍රියා කරන්නේ නම් ඒ අය සඳහා ස්ථාන මාරුවීම් හෝ තනතුරෙන් නෙරපීමට කටයුතු කරන ලෙස පරිපාලනය වෙත දැනුම් දුන් අතර ආදායම් අංශයේ අංශ ප්‍රධාන, ප්‍රධාන කළමණාකරන සේවා නිළධාරි හා ආදායම් පරීක්ෂක මහතාගෙන් උත්පාදනය කර ඇති ආදායම් මොනවාද, හිඟ ආදායම් මොනවාද යන්න හඳුනා ගෙන එම ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළයුතු බවත් ආදායම් එකතු කිරීමට දෛනිකව හෝ පිටතින් සේවකයින් බඳවා ගෙන ආදායම් එකතු කිරීමට කටයුතු කළයුතු බවත් විධිමත්ව පරිපාලනය සිදුවියයුතු බව පැවසීය. ගබඩාවද කිසිම වගකීමක් නොමැතිව සිදුවන බවත් එම භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කළයුතු බවත් ගබඩාවෙහි නිවැරදිව සිදු නොවීම නිසා භාණ්ඩ අස්ථාන ගතවීම් සිදුවන බව පැවසීය. එබැවින් ඒ වගකීම රහිතව සිදුකරනු ලබන මෙම කටයුතු

වගකීම සහිතව සිදු කිරීමට පරිපාලනය කටයුතු කරන ලෙස පැවසීය. විශ්‍රාම ගැනීමේදී නිවැරදි ලේඛන ගතවීම් නොවීම නිසා ඒ අයට විශ්‍රාම වැටුප ගැනීමට නොහැකි වනු ඇති බවත් එබැවින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා විධිමත්ව පරිපාලන කටයුතු සිදුකරන ලෙස සහා ලේකම්තුමිය වෙත දන්වා සිටින ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ අංක 01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 10, 11, 12, 13, 14, 16, 17, 18, 19, 20, 21 නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබාදීමටත් , **ජල ගබඩාව තුල ගොඩගසා ඇති ඉවත් කරන ලද පරණ ජල මීටර් තොගය, ගබඩාව ඉදිරිපස ගොඩගසා ඇති නල ලිං අබලි තොගය හා ට්‍රැක්ටර් රිම් තොගය හඳුනාගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම සුදුසු වේ** යන 15 වන නිර්දේශය සඳහා අනුමැතිය ලබා නොදී නැවත මේ පිළිබඳව පරීක්ෂාවක් කර අලුත්වැඩියා කිරීම සිදුකර ප්‍රයෝජනයට ගතහැකි නම් ඒවා අලුත්වැඩියා කිරීමට සුදුසු බවත්, **වාහන අංගනයේ දිරාපත් වෙමින් පවතින අත් ට්‍රැක්ටර් ට්‍රේලරය හා ට්‍රැක්ටර් ට්‍රේලරය අපහරණය සඳහා යාන්ත්‍රික අධ්‍යක්ෂගේ නිර්දේශ මත කටයුතු කිරීම සුදුසු වේ** යන 22 වන නිර්දේශයෙහි අත්ට්‍රැක්ටර් ට්‍රේලරය අපහරණය කර ට්‍රැක්ටර් ට්‍රේලරය අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමටත් , **වාහන අංගනයේ දිරාපත් වෙමින් පවතින ලොතරැයි කුඩු හා ජංගම කුඩු මෙන්ම අනෙකුත් අබලි ද්‍රව්‍ය හඳුනාගෙන වෙන්දේසි කිරීම යෝග්‍ය වේ** යන 23 වන නිර්දේශයේ සඳහන් දිරා පත් වෙමින් පවතින ලොතරැයි කුඩු හා ජංගම කුඩු සියල්ල වෙන්දේසි නොකර භාවිතයට ගතහැකි තත්වයෙන් පවතින ලොතරැයි කුඩු හා ජංගම කුඩු නැවත ව්‍යාපාර කිරීමට කැමති ඉල්ලුම් කරනු ලබන ජනතාව වෙත ලබා දී ව්‍යාපාරික අවස්ථා ඇති කිරීමට සුදුසු බවට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 11.40ට ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා, ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමා , ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටව යන ලදී.

## (ඉ).01.06. ජල බවුසරය සඳහා ගෙවූ මුදල නැවත ලබාදීම සම්බන්ධවයි.

එම්.එම්.තිළිණ ප්‍රසාද් මහතා විසින් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල බවුසරය 2026.03.16 දින ලබා ගැනීම සඳහා 2026.03.10 දින රු.6000.00 ක මුදලක් ගෙවා ඇත. නමුත් එදිනට ජල බවුසරය ලබා දීමට බිබිල ප්‍රාදේශීය සභාවට නොහැකි වූ බැවින් එම මුදල නැවත ලබා දෙන ලෙස එම මහතා ඉල්ලුම් කර ඇත. එම මුදල ලබාදීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.07. pc 36624 දරණ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට නොහැකි වීම සම්බන්ධවයි.

pc 36624 දරණ ගිණුම් අංශයේ ස්ථාපිත කර ඇති ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට නොහැකි ලෙස අක්‍රිය වී ඇති බව 2026.03.23 දිනැති ලිපිය මගින් ජෝන් කීල්ස් ආයතනය දන්වා එවා ඇති බවත් මෙම තත්වය මත ඡායා පිටපත් ගැනීමේදී ගිණුම් අංශයට දැඩි අසීරුතාවයකට මුහුණදීමට සිදුව ඇත. මේ වන විට නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයුම් කමිටුවට යවා ඇති බැවින් ඒ අනුව ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා ස්ථිර කරන ලදී.

<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාවට PC 36624 ඡායා පිටපත් යන්ත්‍රය ජෝන් කීල්ස් ආයතනයෙන් මිලදී ගෙන එම ආයතන විසින් ම වාර සේවා සිදු කිරීමට ගිවිසුම් ගතවී ඇති බැවින් පෙනී යන්නේ එම ආයතනය විසින් තම ආයතනයටම ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා සිදුකර ගෙන ඇති ක්‍රියාවලියක් බව පැවසීය. ජෝන් කීල්ස් ආයතනයෙන් නොව වෙනත් ආයතනයකින් මෙම ඡායා පිටපත් යන්ත්‍රය පරීක්ෂා කර බැලීමට ඉදිරිපත් කරමු යැයි පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවෙහි ගිණුම් අංශයෙහි ස්ථාපිත කර ඇති PC 36624 ඡායා පිටපත් යන්ත්‍රය නැත අලුත්වැඩියා කළ නොහැකි ලෙස අක්‍රියව ඇති බව මෙම ඡයා පිටපත් යන්ත්‍රය මිලදී ගෙන ඇති ජෝන් කීල්ස් ආයතනය විසින් දන්වා ඇති බැවින් , ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කරනු ලබන වෙනත් ආයතනයක් වෙත යොමු කර පරීක්ෂා කර බලා අලුත්වැඩියා කිරීමට හැකි නම් අලුත්වැඩියා කිරීමටත්

එසේ අලුත්වැඩියා කළ නොහැකි නම් නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමටත් සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

## (ඉ).01.08. බහුකාර්ය ගොඩනැගිල්ලට ආධාර ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල, දියකොබල , හැපොළ ,පෙරියපැලැස්ස, සමාජ සේවා සහනාධාර සමිතිය මගින් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙහි පෙර පාසලක් , ළමා සමාජයක් හා අනෙකුත් සියළු සමිති සමාගම් මෙම ගොඩනැගිල්ලෙහි පවත්වනු ලබයි. නමුත් එම ගොඩනැගිල්ල ඉතා අබලන් තත්වයේ පවතින බැවින් සමිතියේ දායකත්වයෙන් අඩි 80 x 20 නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා බිත්ති බැඳ වහලය ගසා ඇති අතර ඉතිරි වැඩ නිම කර ගැනීම සඳහා සමිතියට ශක්තියක් නොමැත. බිත්ති කපරාරු කිරීම ,පොළොව කොන්ක්‍රීට් කිරීම, සිමෙන්ති දැමීම සඳහා සිමෙන්ති මිටි 100ක් පමණ අවශ්‍ය වන බැවින් ඉහත කරුණු සලකා බලා සහයෝගය ලබා දෙන මෙන් බිබිල ප්‍රාදේශීය සභාවෙන් සමාජ සේවා සහනාධාර සමිතිය ඉල්ලුම් කර ඇත. මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල, දියකොබල , හැපොළ ,පෙරියපැලැස්ස, සමාජ සේවා සහනාධාර සමිති ගොඩනැගිල්ලෙහි වැඩ අවසන් කර ගැනීම සඳහා සිමෙන්ති කොට්ටා 100ක් ලබාදීම සඳහා සහා අරමුදලින් රු.280,000.00ක මුදලක් ආණ්ඩුකාර අනුමැතියට යටත්ව බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරි ඇස්තමේන්තුවට අනුව ලබාදීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).01.09.සතිපොළ සඳහා දෛනික පදනම මත සේවකයින් යොදවා ගැනීම සම්බන්ධවයි.**

බිබිල සතිපොළ පිරිසිදු කිරීමේ කටයුතු , මුර කටයුතු , හා සතිපොළ ආදායම් රැස් කරන සේවක මහතාට සහාය වීම සඳහා සේවයේ යොදවා සිටින ආර්.එම්. ප්‍රදීප් නුවන් සම්පත් මහතා සහ ආර්.එම්. දුමින්ද පුෂ්ප කුමාර මහතා යන දෙදෙනා හට 2026 ජනවාරි මාසයේ සිට දෛනික පදනම මත වැටුප් ගෙවීම අනුමත කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

__ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා__

2026.01.22 මහ සභාව මගින් කම්කරුවන් බඳවා ගැනීම සඳහා සභා තීරණයක් ලබා ගත් බවත් ලිපි හුවමාරුවේදී කාලය ගත වී අප්‍රේල් 02 වනදා ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. සේවක අවශ්‍යතාවය මත ජනවාරි මස බඳවා ගත් ආර්.එම්. ප්‍රදීප් නුවන් සම්පත් සහ ආර්.එම්. දුමින්ද පුෂ්ප කුමාර යන සේවක මහතුන් දෙදෙනා හට අප්‍රේල් 02 වනදා සිට 09 වන දා දක්වා සේවය කළ දිනයන් සඳහා දෛනික වැටුප් ලබාදුන් අතර එම මහතුන් හට බඳවා ගත් දින සිට අප්‍රේල් 02 දින දක්වා වැටුප් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බැවින් එම සේවක මහතුන් හට වැටුප් ගෙවීමට ගරු සභාවේ එකඟතාවය අවශ්‍ය බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා ප.ව.12.15ට සභා ගර්භයට පිවිසෙන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.10.මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහල " ඒ " ශ්‍රේණියේ රෝහලක් බවට පත් කිරීම සම්බන්ධවයි.**

මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහල " ඒ " ශ්‍රේණියේ රෝහලක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

__ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා__

බිබිල ප්‍රදේශයට මෙන්ම ලෝකයටම විශාල සේවයක් ඉටුකළ පුද්ගලයකුගේ නමකින් ආරම්භ කර ඇති බිබිල මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහල A ශ්‍රේණියේ රෝහලක් බවට පත් කිරීමට අනුමැතිය ලබා දෙමු යැයි පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.11.සිරි සඟබෝ මාවතෙහි ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන වෙන් කර ගැනීම.

බොකාගොන්න වසමෙහි සිරිසඟබෝ මාවතෙහි ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සභා අරමුදලින් රු.2,000,000.00ක් ප්‍රතිපාදන වෙන් කරගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

2025 වර්ෂයේ රු.2,000,000.00 ක ලැබුණු ප්‍රතිපාදන මගින් මෙම මාර්ගය දෙසැම්බර් මාසයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ අතර දිට්වා සුළි කුණාටුවත් සමඟ මෙම මාර්ගයෙන් මැටි සහිත මාර්ග කොටසක් හා උස් ස්ථානයක ඉදිකර ඇති බෝක්කු කොටසක් ඉදිකිරීමට නොහැක් වූ බැවින් එම කොටස ඉදි කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය. කෙසේ වුවද මෙම මාර්ග කොටසෙන් මගීන්ට ගමන් කළහැකි ආකාරයට තාවකාලිකව ඉදිකළ බව පැවසීය. සභා අරමුදලින් රු. .2,000,000.00 ක් වැය කරනු ලබන්නේ මෙම බෝක්කු කොටස ඉදිකිරීමට පමණක් නොව මෙම මාර්ගය කැඩී ඇති ස්ථානද ප්‍රතිසංස්කරණය කිරීමට බව පැහැදිලි කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

මෙම යෝජනාව සඳහා ඉතා ඉහළින් කැමති වුවද බිබිල ප්‍රාදේශීය සභාව සතුව විශාල අරමුදලක් නොමැති බැවින් හා මෙම මාර්ගය සඳහාම මිලියන 2ක මුදලක් වෙන් කරන විට ප්‍රදේශයේ අනෙකුත් ජනතාවගේ බලාපොරොත්තු ඉටු කර තිබෙනවාද යන්නයි. බිබිල නගරයේ මස් මාළු කඩ අලුත්වැඩියා කිරීම, එහි ගලි වලවල් ඉදිකිරීම , අලුතින් ඉදිකළ වැසිකිළිය අලුත්වැඩියා කිරීම හා නගරයේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම ආදිය සඳහා විශාල මුදලක් සභා අරමුදලින් වැය කිරීමට තිබෙන බැවින් එක් කොට්ඨාසයක මාර්ගයක් ඉදි කිරීමට මෙතරම් විශාල මුදලක් වැය කිරීම එතරම් සුදුසු නොවන බවත් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් අනෙකුත් කොට්ඨාස වලද මෙවැනි මාර්ග පාලම් බොක්කු ඉදි කිරීමට තිබෙන බවත් එබැවින් එකම මාර්ගයකට මෙවැනි මුදලක් වෙන් කිරීම සුදුසු නොවන බව පැවසීය.

නගරාසන්නයේ විශාල ගැටලු පවතින බැවින් එම ඉදිකිරීම් සිදු කිරීමට බිබිල සතිපොළ ආශ්‍රිත ඉදිකිරීම් ආදිය සිදු කිරීම සඳහා කාර්මික නිළධාරි මහතුන්ගෙන් ඇස්තමේන්තු සකස් කරවා ගෙන ඒවා ඉදි කිරීමට මූලිකත්වය ගන්නේ නම් සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා</u>

වසම් 40හිම අත්සන් මුල්ලක් නැර තමන් ගමන් කරන බැවින් ඉතා අති දුෂ්කර මාර්ග මෙම වසම් 40හිම පවතින බව දන්නා බවත් එබැවින් ඒ සඳහා අවධානය යොමු කරන්නේ නම් ඉතා සුදුසු බව පැවසීය. කරාඩුගල වසමෙහි ගම්මානයට යන මාර්ගයෙහි බෝක්කු කැඩී ඇති බැවින් ජනතාව එහා මෙහා යනු ලබන්නේ පිට ලැල්ලක් යොදාගෙන එය මඟින් බව පැවසීය. මෙම මාර්ගයේ කි. මී. 4ක් පමණ ජනතාව ඉතා අති දුෂ්කර ලෙස ගමන් කරන බවත් ලෙඩෙකු වුවද රැගෙන ඒම ඉතා අති දූෂ්කර බැවින් සිරිසඟබෝ මාවතේ මෙම මාර්ගය ඉදි කිරීමට විරෝදතාවයක් නොවන බවත් මෙම කරාඩුගල මාර්ගය ඉදිකිරීම සඳහා රු.1,000, 000.00 ක මුදලක් වෙන් කර කඩිනමින් ඉදිකර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය</u>

පේරගස්පිටිය මාර්ගය ඉදිකිරීමට අනුමත වී ඇත්දැයි ගරු මූලාසනයෙන් විමසා සිටින ලදී.

<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>

පළාත් සභා අරමුදලින් හා ග්‍රාමීය සංවර්ධන යෝජනා මඟින් මේ වනවිට වසම් කිහිපයකම මිලියන 2ක බැගින් වූ මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 22ක් පමණ සිදුකර තිබෙන බවත් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වසම් 40ටම මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇති බවත් පැවසීය.

කරාඩුගල මාර්ගය ඉදිකිරීම සඳහා යෝජනාව ඉදිරිපත්කර ඇති බවත් මෙම මාර්ගය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2ක ප්‍රතිපාදන වෙන් වී ඇති බවත් මෙම මාර්ගය කඩිනමින් ඉදිකිරීමට කටයුතු කරන බවත් පැවසීය. පේරගස් පිටිය මාර්ගය ඉදිකිරීමට අනුමත වී ඇති බවද පැවසීය.

2026 වර්ෂයේ දී ඉදි කිරීමට අනුමත වී ඇති යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබෙන නමුත් භාණ්ඩ මිල 15%ක් 20% ක් ඉහළ ගොස් ඇති බැවින් එම සමිති සඳහා ව්‍යාපෘති ලකෂ 20 සීමාවේ ලබා දෙන බැවින් ඊට වැඩි කරන්නේ නම් නැවත ප්‍රතිපාදන ක්‍රියාවලියකට යායුතු වන බවත් එසේ නැතිනම් රුපියල් ලක්ෂ 20ක මුදලින් ඉදිකළ හැකි ප්‍රමාණයට ව්‍යාපෘතිය කුඩා කිරීමට සිදුවන බවයි. නමුත් රජය මෙම ව්‍යාපෘතිය අඩුවෙන් කිරීමට අකමැති බැවින් ගිවිසුම් අත්සන් කර තබා ගන්නා ලෙස දැනුම්දී ඇති බවත් හැකි ඉක්මණින් වැඩිවන මුදල වෙන් කර ගැනීමට යෝජනා සම්මත කර ගැනීමට කටයුතු කරන බවත් පැවසීය. රජය විසින් මෙම සංවර්ධන යෝජනාවල පළමු අදියර 2026 මැයි මස වන විට අවසන් කිරීමට තීරණය කර තිබූ බවත් පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## <u>(ඉ).01.12. බිබිල බස් නැවතුම්පොළ ඉහළ මාලයෙහි පොලිස් මුරකුටියක් ඉදි කිරීම.</u>

බිබිල බස්නැවතුම්පොළෙහි උඩු මහලෙහි රු. 226,287.79 ක ඇස්තමේන්තුවට අනුව පොලිස් මුරකුටියක් ඉදි කිරීම සඳහා සහා අරමුදලින් වැය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා**

මෙම ඇස්තමේන්තුව බඩු මිල ඉහළ යාමට පෙර සකස් කළ බැවින් මේ සඳහාද මෙම මුදලට වැඩියෙන් වැය වන බව පැවසීය. මගී ප්‍රවාහන අධිකාරිය විසින් පොලිස් මුරකුටිය සඳහා දෙවන මහලෙහි ස්ථානයක් වෙන් කර ඇතිබව පැවසුවද එම ස්ථානය මේ වන තෙක් නිදහස් කර නොදීම නිසා පළමු මහලෙහි මෙම මුරකුටිය ඉදි කිරීමට තීරණය කළ බව පැවසීය. පොලිස් නිළධාරීන්ගේ වෘත්තීය ගරුත්වය රැකෙන ආකාරයට උඩින් වහලක් සහිතව විධිමත් ලෙස කුටියක් ඉදිකර දෙන ලෙස පොලීසිය මගින් නිතර ඉල්ලීම් කරන බැවින් ජනතාවගේ ආරක්ෂාව පෙරටු කරගෙන මෙම මුර කුටිය ඉදිකිරීමක් නොව කොටස් ගෙන ගොස් එකලස් කර සකස් කිරීමට කටයුතු කරන බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.13. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

2026.04.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල සතිපොළ අසල පළතුරු බීමහල (සභාවට අයත් F කඩකාමරවල පහත මාලයෙහි ආරම්භක කඩකාමරය) සඳහා 2023.08.16 දින ප්‍රසම්පාදනයෙන් තෝරාගන්නා ලද බිබිල, කිවුලපිටලන්ද, සිසිල සෙවණ ලිපිනයෙහි පදිංචි ආර්.වී.ජේ.ආර්.ජයසිංහ මහතා සඳහා වසරක කාලයක් සඳහා බදු දීමටත් ගිවිසුම්ගත වන දින සිට බිල් කිරීමටත් ජල විදුලිය සැපයුම බිබිල ප්‍රාදේශීය සභාව මගින් ලබාදී ගෙවීම් කටයුතු පළතුරු බීමහල ලබා ගන්නා බදුකරු විසින් ගෙවීම් සිදුකළ යුතු බවටත්, එහි ගලිවල ප්‍රාදේශිය සභාව මගින් සකස් කර ලබා දීම.

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ළමා උද්‍යානය අසල කිරිහල සඳහා ලබා ගෙන ඇති විදුලි සැපයුම සභාව නමට වෙනස් කිරීමටත් එම කිරිහලේ අඩුපාඩු සභාව මගින් සකස් කර දී, බදු කුලිය තක්සේරු කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

3. බිබිල ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය ජල නල උපාංග හා විදුලි උපාංග මාස 06 කට අවශ්‍ය ප්‍රමාණය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ | අයිතම විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | 20mm(1/2”) Ball Valve PVC | 15 |

| | | |
|---|---|---|
| 02 | 50mm(1/2") Valve | 20 |
| 03 | 32mm(1") Valve | 50 |
| 04 | 63x20 Clamp saddle | 20 |
| 05 | 90x20 Clamp saddle | 20 |
| 06 | 110mm Eqval Tee | 03 |
| 07 | 110x63mm Reduce Tee | 05 |
| 08 | 20mm((1/2) Tap | 250 |
| 09 | 20mm(1/2) Stop Valve | 50 |
| 10 | 20mm(1") Elbow | 50 |
| 11 | 40mm(1 ¼) Valve Socked | 20 |
| 12 | 63mm(2") Valve Socked | 20 |
| 13 | 20mm(1") Forcef Socked | 20 |
| 14 | 40mm(1 ¼) Forcef Socked | 10 |
| 15 | 20mm(1/2) Tee Socked | 50 |
| 16 | 25mm(3/4) Tee Socked | 20 |
| 17 | 32mm(1") Tee Socked | 10 |
| 18 | 40mm(1 ¼) Tee Socked | 10 |
| 19 | 63mm(2") Tee Socked | 10 |
| 20 | 25mm(3/4) Elbow | 20 |
| 21 | 63mm(2") Elbow | 20 |
| 22 | 25mm(3/4) Elbow | 10 |
| 23 | 50mm x 20mm(1 ½ x ½ Reduc Socked) | 10 |
| 24 | 90mm x 20mm(3 x ½ Reduce Socked) | 20 |
| 25 | 20mm(1/2) Tap | 100 |
| 26 | 90mm(3") Repair Socked | 15 |
| 27 | 100mm(4") Repair Socked | 05 |
| 28 | Water Meter | 100 |
| 29 | Ferrul 20mm | 75 |
| 30 | Lockable Valve | 100 |
| 31 | 40mm PVC Pipe(PNT 14) | 100 |
| 32 | 32mm PVC Pipe(PNT 14) | 100 |
| 33 | 63mm PVC Pipe(PNT 14) | 100 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

මහ සභාව මඟින් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නද මෙම මුදල වැය කර අදාළ කාර්ය සිදුකළේද ඒ සඳහා මුදල් වැය වූ ආකාරය පිළිබඳව සභාව දැනුවත් නොවන බැවින් ඒ පිළිබඳව වාර්තා ඉදිරිපත් කළයුතු බව පැවසීය.

**ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා**

වියදම් වාර්තා කමිටුව සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස සභා ලේකම්තුමිය දැනුවත් කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).01.14. බිබිල මහජන පුස්තකාලය සඳහා ස්ථානය හඳුනාගැනීමේ (මග පෙන්වීම) නාම පුවරුවක් සකස්කර ගැනීම සම්බන්ධවයි.

බිබිල මහජන පුස්තකාලය වෙත දෛනිකව පැමිණෙන පාඨක ප්‍රජාවට සහ විශේෂයෙන් ප්‍රදේශයෙන් බැහැරව පැමිණෙන පාඨකයින් හට පුස්තකාලය පිහිටි ස්ථානය පහසුවෙන් හඳුනා ගැනීම සඳහා මග පෙන්වීමේ නාම පුවරුවක අවශ්‍යතාවය දැඩිව පවතින බැවින් ඇන්ඩර්සන් සිල්වා මාවත ආරම්භ වන ස්ථානයේ ,එනම් බිබිල ප්‍රාදේශීය සභා ප්‍රධාන පිවිසුම් දොරටුව ඉදිරිපිට **" බිබිල මහජන පුස්තකාලය - 50m "** ලෙස සඳහන් දකුණු පසට යොමු වූ ඊතලයක් සහිත නාම පුවරුවක් ස්ථාපිත කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය ප.ව.12.40 ට සභා ගර්භයට පැමිණෙන ලදී.

## (ඉ).01.15. බිබිල පුස්තකාලයේ CCTV පද්ධතියේ කැමරා 03ක් අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

බිබිල මහජන පුස්තකාලයේ පිවිසුම් ස්ථානය, සඟරා අංශය, ඉහළ මහලයේ අධ්‍යන අංශය යන ස්ථාන තුනෙහි CCTV කැමරා පද්ධතියේ කැමරා 3ක් මේ වන විට අක්‍රීය තත්වයේ පවතී. පුස්තකාලයේ සියළුම අංශ ආවරණය වන පරිදි යොදා ඇති මෙම කැමරා පද්ධතිය සම්පූර්ණ ලෙස ක්‍රියා කළයුතු බැවින් මෙම CCTV කැමරා 3 අලුත්වැඩියා කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.16 මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් තිරය රඳවා තබා ගතහැකි ආධාරකයක් සකස් කරගැනීම සම්බන්ධවයි.**

බිබිල මහජන පුස්තකාලය සතුව මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් හා එයට අදාළව තිරයක් පවතී. එම යන්ත්‍රය භාවිතා කරන විටදී තිරය රඳවා තබා ගැනීමට ආධාරකයක් නොමැති වීම නිසා තිරය භාවිතා කිරීමට අපහසු වී ඇත. එම නිසා තිරයේ දිග පළල අනුව එය රඳවා තබා ගත හැකි ආධාරකයක් සකස් කර දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.17. බිබිල නගරයේ අංක 01 කඩ කාමරයේ පවත්වාගෙන යනු ලබන එළගවමස් ව්‍යාපාරය අංක 02 කඩ කාමරයට මාරු කිරීම සම්බන්ධවයි.**

එම්.එච්.එම්.නසීර් මහතා 2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශිය සභාවට අයත් අංක 01 එළගවමස් කඩය ටෙන්ඩර් මඟින් බදු පදනම මත ලබා ගෙන ඇත. අංක 01 කඩ කාමරයේ පවත්වා ගෙන යනු ලබන මෙම ව්‍යාපාරය සඳහා වාර්ෂික වෙළඳ බලපත්‍රය ලබා ගැනීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශය ලබා දී නොමැත. එයට හේතුව කඩ කාමරය ඉදිරිපිට ඇති මලාපවාහන පද්ධතිය හා කාණු පද්ධතියෙන් සිදුවන සෞඛ්‍ය ගැටළුව බවයි. දැනට මෙම වෙළඳ සැළෙන් ඉවත් කරන අප ද්‍රව්‍ය ප්‍රාදේශිය සභාවේ කසල ගෙන යන වාහන වලින් රැගෙන යනු නොලබන බවත් බදුකරු විසින් දන්වා එවා ඇති අතර මෙම කරුණු සලකා බලා මෙම වෙළඳසැල අංක 01 කඩ කාමරයෙන් අංක 02 කඩ කාමරය වෙත මාරුකර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. එබැවින් එම වෙළඳසැළ අංක 01 කඩ කාමරයෙන් අංක 02 කඩ කාමරය වෙත මාරුකර දීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).01.18. බිබිල නගරයේ අංක 01 එළගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන එම්.එච්.එම්.නසීර් මහතා විසින් හිඟ මුදල සඳහා ගලපා ඇති ප්‍රමාද ගාස්තු ඉවත් කර මුදල පමණක් ගෙවීමට අවස්ථාව ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.</u>**

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශිය සභාවට අයත් අංක 01 එළගවමස් කඩය ටෙන්ඩර් මඟින් බඳු ලබා ගෙන ඇති එම්.එච්.එම්.නසීර් මහතා පළමු කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු මුදලෙන් කොටසක් ගෙවා ඇත. ගෙවීමට ඇති හිඟ මුදල සඳහා දඩ මුදලක් අයකළ යුතු බව ප්‍රාදේශිය සභාව විසින් දැනුවත් කර ඇති බවත් දැනට කණුල්වෙල ගව සාතකාගාරයක් නොමැති අතර කොටබෝව හා ගොඩිගමුව ගව සාතකාගාරය ද අක්‍රියව පවතින බැවින් බකිණිගහවෙල ගව සාතකාගාරයේ සිට මස් ප්‍රවාහනය කිරීමට සිදුව ඇති බැවින් හිඟ මුදල් සඳහා ගලපා ඇති දඩ මුදල ඉවත් කර කුලී මුදල පමණක් ගෙවීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

එළගව මස් කඩ කාමර අංක 01 හිඟ මුදල සඳහා ගලපා ඇති ගිවිසුමෙහි ප්‍රමාද ගාස්තු හා අතුරු ව්‍යවස්ථාවෙන් අය කිරීමට දක්වා ඇති ප්‍රමාද ගාස්තු පිළිබඳව හා අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ගැලපීම් කර ගිවිසුම් මගින් හිඟ මුදල සඳහා අය කිරීමට ඇති ප්‍රමාද ගාස්තු දක්වා ඇත්දැයි සමාලෝචනය කර වාර්තාවක් සමඟ ඉදිරි සභාවාරයට ඉදිරිපත් කරන ලෙස සභා ලේකම්තුමියට දන්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය</u>**

බිබිල ප්‍රාදේශීය සභාවට හිමි කඩ කාමරවල ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන බදුකරුවන් සියලු දෙනා හට හිඟ මුදල සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු අඩු කිරීම සඳහා ඉල්ලීම් ලිපි ලබා ගැනීම සුදුසු බවත් එසේ නොවුනහොත් දිගින් දිගටම හිඟ මුදල් සඳහා අය කරනු ලබන පොලී ප්‍රතිශත අඩු කර ගැනීමට ව්‍යාපාරිකයින් කටයුතු කරනු ඇතැයි පැවසීය.

**<u>ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>**

අංක 01 එළ ගවමස් ව්‍යාපාරය දැනට පවත්වා ගෙන යනු ලබන බදුකරු වන එම්.එච්.එම්. නසීර් මහතා අද දින සභාවේදී තීරණයක් ලබා ගත්තේ යැයි සිතා මෙම හිඟ මුදල සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තුව නොගෙවීමට කටයුතු කරනු ලබතැයි සිතන බවත් එබැවින් මෙම මස ද ගෙවූ ආකාරයටම මුදල් අය කළයුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා</u>**

එම්.එච්.එම්. නසීර් මහතා ඉල්ලුම් කරනු ලබන්නේ දඩ පොළිය කපා හැරීමට බැවින් ගරු සභාපතිතුමා දන්වන පරිදි දැනට දිනකට අය කරනු ලබන ප්‍රමාද ගාස්තු අනුපාතය වන 1% ඉදිරියේ දී මාසයක 10%ක් දක්වා අඩුකර අය කිරීම සඳහා මෙම බදුකරුගෙන් ඉල්ලීම් ලිපියක් ලබා ගැනීමට සුදුසු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

එළගවමස් ව්‍යාපාරය අංක 01හි ගිවිසුමෙහි ඇතුළත් හිඟ මුදල් සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සකස් කර තිබේදැයි පරීක්ෂා කර බලා ඒ පිළිබඳව සමාලෝචන වාර්තාවක් සකස් කර ඒ සමඟ ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සඳහා කල් තබන ලදී.

## <u>(ඊ). කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.</u>

- 2026.03.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.04.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.04.10.දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

## <u>(උ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.</u>

2026 මාර්තු මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

<u>ආදායම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 9,621,086.90 |
| මූලධන ලැබීම් | - රු. 1,481,659.83 |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - <u>රු. 6,442,182.26</u> |

| | | |
|---|---|---|
| | මුළු ලැබීම් | - රු.17,544,928.99 |
| **වියදම්** | | |
| | පුනරාවර්තන වියදම් | - රු. 8,993,812.12 |
| | ප්‍රාග්ධන වියදම් | - රු. 6,900.00 |
| | ණය ආපසු ගෙවීම් | - රු. - |
| | වෙනත් වියදම් | - රු. 8,398,465.32 |
| | ආයෝජන | - රු. - |
| | මුළු වියදම් | - රු. 17,398,977.44 |

**2026.03.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 23,784,933.96 |
| අක්කර බදු | - රු. 11,840.58 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 2,130,020.50 |
| ජල ගාස්තු රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 786,469.00 |
| කුලී මුදල් | - රු. 1,701,633.34 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,916,997.72 |
| එකතුව | - රු. 31,331,865.10 |

## (ඌ).වෙනත් කරුණු

**(ඌ).01. ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා සභාවට සහභාගි නොවූ 2026.03.19. දින පැවති මහ සභාව සඳහා දීමනා ගෙවීම.**

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා සැත්කමක් සිදුකර රෝහල්ගතව සිට 2026.03.18 දින නිදහස්ව පැමිණ ඇති බවට වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇත. 2026.03.19 දින මහ සභාව රැස්වූ බැවින් එදින සභාවට සහභාගි නොවූ අතර එතුමාගේ නිවාඩුද එම සභාවේදී අනුමත කළ බැවින් එතුමාට දීමනා ගෙවීමට අනුමැතිය ලබාදීම පිළිබඳව සාකච්ඡා කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමාට 2026.03.19 දින මහ සභාව සඳහා දීමනා ගෙවීමට සුදුස බව යෝජනා කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකත්වය තමා මේ වන විට දරණ බවත් පෞද්ගලික ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කළ බැවින් ඒ සඳහා සහභාගිවීමට නොහැකි වන බැවින් එම කමිටුවෙන් ඉල්ලා අස්වන බව දන්වා සිටින ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

ඊළඟ මහ සභාව මගින් ප්‍රසම්පාදන කමිටුවට නව සාමාජිකයෙකු පත් කර ගන්නා තෙක් ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගි වන ලෙස දන්වා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

ඌව පළාත් සභාව මගින් චක්‍රලේඛයක් නිකුත් කර ගම්මැද්ද කළාලය නමින් පළාතේ ස්ථාන 28 ක මාසයේ අවසන් සතියේ සිකුරාදා සවස 6.00 සිට රාත්‍රී 9.00 වන තෙක් Fun Friday නමින් වැඩ සටහනක් පවත්වනු ලබයි. බිබිල ප්‍රදේශයේ පවත්වනු ලබන මෙම වැඩසටහන බිබිල ප්‍රාදේශීය සභාවේ මූලිකත්වයෙන් සිදු කරන අතර මේ සඳහා තමා සහ විශ්‍රාමික විදුහල්පතිවරයෙකු වන නාගල සිරිවර්ධන මහතා පළාත් සභාව මගින් නම් කර එවා ඇති බවත් මෙහි පළමු වැඩසටහන නාගල කොට්ඨාසයේ නාගල විද්‍යාලයේදීත් දෙවන වැඩසටහන දොඩම්ගොල්ල කොට්ඨාසයේ දොඩම්ගොල්ල විද්‍යාලයේදීත් පැවැත්වූ බව පැවසීය. මාස 10ක් තුළ කොට්ඨාස 10 තුළම මෙම වැඩසටහන පැවැත්වීමට බලාපොරොත්තු වන බව පැවසීය.

පූර්ව ළමාවියේ වැදගත්කම , පවුලේ බැදීම, තරුණ දරුවෙකු සමඟ ගනුදෙනු කිරීම , ආහාර සංස්කෘතිය, නිවසක පිරිසිදුකම, ගෙවතු වගාව , ණය ගැනීම,ණය කළමණා කරනය, පවුලේ විනෝදය, සමාජ සේවය, දරුවන්ගේ අධ්‍යාපනය, රැකියා අවස්ථා, පවුලක ආදායම් උත්පාදනය, ආබාධිත දරුවන් රැක බලා ගැනීම, වැඩිහිටියන්ට ගරු කිරීම, පවුලක ආචාර ධර්ම, සිරිත් විරිත් හා ආචාර ධර්ම යන කරුණු කාරණා 17ක් හා අරමුණු 50ක් යටතේ මෙම වැඩසටහන දියත් කරන ලෙස ප්‍රාදේශීය සභාව වෙත පවරා ඇති බව පැවසීය.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරි 12ක් මේ සඳහා සම්බන්ධ කර ගන්නා ලෙස දන්වා ඇති බවත් මෙවර බුළුපිටිය වසම මූලික කරගෙන බුළුපිටිය මහා විද්‍යාලයේ දී මෙම වැඩසටහන පැවැත්වීමට තීරණය කර ඇති බව පැවසීය. මෙම වැඩසටහන දේශපාලන මට්ටමින් නොව රාජ්‍ය තන්ත්‍රය , රාජ්‍ය තන්ත්‍රයේ වගකීම් දැනුම්දීම්, එනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව වැනි රාජ්‍ය ආයතන වලින් සිදු කරන කාර්යයන්, සේවාවන් , දරුවන්ට රැකියා අවස්ථාවන් , දරුවන්ට අධ්‍යාපන අවස්ථාවන් පෙර පාසල් ළමාවිය පිලිබඳව මෙම වැඩසටහන මගින් දැනුවත් කරන බවත් පැවසීය. වසම තුළ පවත්නා ගැටලු පිළිබඳව එම ප්‍රදේශයේ සිට සාකච්ඡා කිරීමට ඒ සම්බන්ධ නිළධාරීන් ද සහභාගි වන බවත් ඒ අයගේ ගැටලු , එම ගැටලු නිරාකරණය කිරීමට උපදෙස් ලබා දෙන බවත් පැවසීය. ප්‍රදේශයේ ජනතාවගේ යෝජනා , යෝජනා පෙට්ටියකට රැස් කිරීමටත් මෙහිදී කටයුතු කරන බව පැවසීය.

පළාත් සභාව මගින් මෙම වැඩසටහන පැවැත්වීම සඳහා රු.15000.00ක මුදලක් ගෙවනු ලබන අතර එම මුදල මෙම වැඩසටහන පැවැත්වීමට ප්‍රමාණවත් නොවන බවත් එම අඩුවන මුදල තමා හා සිරිවර්ධන මහතා එක්ව දරන බවත් එය තමන් විසින් සිදුකරනු ලබන සමාජ සත්කාරයක් ලෙස සිතන බව පැවසීය. මෙම ගම්මැද්ද කළාලය වැඩසටහන සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා පැමිණෙන ලෙස ආරාධනා කරනු ලැබීය. මෙම වැඩසටහනේ සමාරම්භය ලෙස බුළුපිටිය පන්සලේදී රැස්වීමක් කැඳ වූ බවත් අද දින බුළුපිටිය පාසලේ දී දැනුවත් කිරීමක් සිදු කරන බවත් , මෙම වැඩසටහන අලි ප්‍රශ්නය නිසා සවස 5.00 සිට ආරම්භ කරන බව පැවසූ අතර මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සියළු දෙනා සහභාගි වී ඔබගේ අදහස් , යෝජනා එම ජනතාව අතර බෙදා හදා ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා

තාක්ෂණ කමිටුව සඳහා සහභාගි වන ලෙස ලැබෙන ලිපිවල එම්.එම්. තිස්ස කුමාර ලෙස සඳහන්ව ඇති බවත් එම නම එම්.එම්.තිස්ස ගුණසිංහ ලෙස නිවැරදි කළ යුතු බවත් අප්‍රේල් 10 දින පවැත්වීමට කටයුතු කර තිබූ තාක්ෂණික කමිටුවේ ලිපිය අද දින ලබාදුන් බවද පැවසීය.

ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා

ශ්‍රී ලංකාවාසී ජනතාවට රාමසාන් , සිංහල හින්දු අලුත් අවුරුද්ද භුක්ති විඳි සමයක් ලෙස මෙම කාල සීමාව හඳුන්වා දිය හැකිය. බිබිල ප්‍රාදේශීය සභාව හා අපි මිතුරෝ ස්වෙච්ඡා සංවිධානය සමඟ එක්ව සංස්කෘතික මණ්ඩලයක් හා සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට තීරණය කරගත් නමුත් සංස්කෘතික මංගල්‍යයට ප්‍රාදේශීය සභාවේ සහයෝගය ඍජු දායකත්වය ලබාදුන් අතර සංගීත ප්‍රසංගය පැවැත්වීම සම්පූර්ණයෙන්ම අපි මිතුරෝ සංවිධානයට භාරදුන් බව පැවසීය.

මෙම සංස්කෘතික මංගල්‍යට සහභාගි වන ලෙස මන්ත්‍රී මණ්ඩලයට හා සභා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ආරාධනා කරනු ලැබූ බවත් මෙම උත්සවය සඳහා ප්‍රාදේශීය සභාවේ මූල්‍යමය දායකත්වය ලබා නොදුන් නිසා සභාවේ තීරණයක් ලබා නොගත් බවත් මන්ත්‍රී මණ්ඩලයට හා සභා ලේකම්තුමිය ඇතුළු නිළධාරි මණ්ඩලයට සංවිධානය සඳහාද සියළු දෙනාට ඍජු දායකත්වය ලබා දෙන ලෙස ආරාධනා නොකළ බවත් පළාත් පාලන ආයතනය මඟින් පවත්වනු ලබන බක්මහ උළෙල නොපවත්වන නිසා මේ සඳහා සහයෝගය ලබා දීමට ප්‍රාදේශීය සභාව තුළ කතිකාවක් තිබූ බව පැවසීය. විවිධ අපහසුතා මධ්‍යයේ සංවිධානය කර මෙම සංස්කෘතික මංගල්‍යය පැවැත්වූවද සියළු දෙනාගේ සහයෝගය ලබා ගැනීමට නොහැකි වූ බව පැවසීය.

සභා ලේකම්තුමිය මේ සඳහා මුල සිටම සහයෝගය ලබා දුන්නද සභාවේ සියළු මහත්ම මහත්මීන්ගෙන් සහයෝගය ලබා ගැනීමට නොහැකි වූ බවත් එම නිසා ප්‍රාදේශීය සභාව සමාජයට දැනෙන වර්ණවත් වන ආකාරට මෙය සිදු කිරීමට නොහැකි වූ බව පැවසීය. මේ සඳහා සභාවේ සේවක මහතුන් කිහිප දෙනෙකුගේ සහයෝගය ලැබූ බවත් සභාවේ වාහන භාවිතා කර සුද්ධ කිරීම් කටයුතු කිරීමත් විවිධ උපකරණ රැගෙන ඒම සඳහා සහයෝගය ලබාදුන් බවත් හා සභාවේ වාහනය යොදා ගෙන ප්‍රචාරන කටයුතු සිදුකල බව පැවසීය. සංගීත ප්‍රසංගය සඳහා ගාස්තු අයකළ බවත් විදුලිය සඳහා විදුලි ජනන යන්ත්‍ර සපයා ගන්නා ලෙස අපි මිතුරෝ සංවිධානයට දන්වා තිබූ බව පැවසීය. රියදුරු මහතුන් ,සේවක මහතුන්, නිළධාරි මහතුන් , පරිපාලනයේ කිහිප දෙනෙකුගේ සහයෝගයෙන් මෙම සංස්කෘතික මංගල්‍යය කිසියම් ප්‍රමාණයකින් සාර්ථක කරගත් බවත් 100% ක් සාර්ථක කර ගැනීමට නොහැකි වූ බව පැවසීය. මේ සඳහා සහභාගි වූ ,සම්බන්ධවූ , උදව් උපකාර කළ සියළු දෙනාට මෙන්ම ශ්‍රමයෙන් සහයෝගය ලබාදුන් සියළු දෙනාටම මෙම අවස්ථාවේදී ස්තූතිය පුදකර සිටි අතර පොලිස් ස්ථානාධිපති තුමා , ප්‍රාදේශීය ලේකම්තුමා ,ප්‍රදේශයේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට හා විදුලිබල මණ්ඩලයේ සියලු දෙනාට හා ප්‍රවාහන අධිකාරියේ නිළධාරි මහත්ම මහත්මීන් ඇතුළු විවිධ ආයතන වලින් සහයෝගය ලබාදුන් සියළු දෙනාටම ස්තූතිය පුද කරන ලදී.

මූල්‍යමය දායකත්වය ලබා නොදුන්නද බිබිල ප්‍රාදේශීය සභාව යන නාමය භාවිතා කරමින් සියළු දෙනාගේ සහයෝගය ලබා ගනිමින් දැවැන්ත උත්සවයක් පැවැත්වීමට බලාපොරොත්තු වූවද වැඩි දෙනෙකුගේ සහයෝගය නොලැබුණු බවත් මේ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙකු විශාල වගකීමක් ලබා ගෙන තම ප්‍රදේශ වලින් ජනතාව ගෙන්වා ගෙන මෙම සංස්කෘතික මංගල්‍යය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් අතර ඒ අයටත් , මෙය වර්ණවත් කිරීමට පැමිණි කලාකරුවන්ට මෙන්ම භාණ්ඩ ආදිය ලබාදුන් සියළු දෙනාටම හා සංගීත ප්‍රසංගය සඳහා සහභාගි වූ ගායන හා වාදන ශිල්පීන් සියළු දෙනාටම ස්තූතිය පුද කරන ලදී.

ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමියගේ සංකල්පයක් වන කලාලය වැඩසටහන බිබිල ප්‍රදේශයේ කොට්ඨාස දෙකක පැවැත්වූ බවත් මෙය පැවැත්වීමේ වගකීම බිබිල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බවත්

මෙම අවස්ථා දෙකම අතිශය සාර්ථක කර ගැනීමට නොහැකි වූ බව පැවසීය. ඌව පළාත් සභා ප්‍රධාන ලේකම්තුමිය විසින් කොට්ඨාස භාර සියළු නිළධාරීන් , ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය සභා ලේකම් තුමියට මේ සඳහා ලැබුණු දායකත්වය අඩුවීම නිසා මෙම වැඩසටහන් දෙකම සාර්ථක කර ගැනීමට නොහැකිවූ බව පැවසීය. ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා , විශ්‍රාමික විදුහල්පති සිරිවර්ධන මහතා හා ස්වෙච්ඡා සංවිධාන වල නිළධාරීන් හා රාජ්‍ය ආයතනවල නිළධාරීන්ගේ සංවිධානත්වයෙන් ජනතාව ඒකරාශි කරගෙන මෙම වැඩසටහන සිදුකළද අතිශය සාර්ථකත්වයට පත්කර ගැනීමට නොහැකි වූ බවත් පැවසීය.මෙම වැඩසටහන් දෙකෙහිදීම වැඩසටහන ආරම්භ කිරීමට පෙරාතුව ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර සූත්‍ර අක්‍රීය වී තිබුණ බැවින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත් මේ වන විට යන්ත්‍ර සූත්‍ර කිසියම් ප්‍රමාණයක් සක්‍රීය මට්ටමේ පවතින බැවින් බුළුපිටිය ප්‍රදේශයේ අප්‍රේල් 24 වනදා කලාලය වැඩසටහන පැවැත්වීමට පෙර එම ප්‍රදේශයේ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට යොදවා ඇති බව පැවසීය. මෙම වැඩසටහන පැවැත්වීම සඳහා සභා ලේකම්තුමිය හා මේ සඳහා යොදවා ඇති නිළධාරි මණ්ඩලය යොදවා සංවිධාන කටයුතු සිදු කරන ලෙසත් ප්‍රජාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමට මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා මෙම වැඩසටහන සඳහා සහභාගි වන ලෙස දැනුම් දෙන ලදී.

ගරු මූලාසනය විසින් 2026 අප්‍රේල් මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2026 මැයි මස අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත මැයි 15 දින පෙ.ව. 9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව අප්‍රේල් මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල - කා.දැ.ගැ.පි

**සංශෝධන -**

(ඉ.01.17. යෝජනාවේ සඳහන් බිබිල නගරයේ අංක 01 කඩ කාමරයේ පවත්වාගෙන යනු ලබන එළ ගවමස් ව්‍යාපාරය අංක 02 කඩ කාමරයට මාරු කිරීම සම්බන්ධවයි යන්නෙහි **අංක 02 කඩ කාමරයට** ලෙස නොව අංක **01 කුකුල් මස් වෙළඳසැලට** ලෙස සංශෝධනය වීම.

(ඉ).01.05. යෝජනාවේ ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩා මැතිතුමාගේ **පුස්තකාලයේ ,පෙර පාසලේ** යන්නට **කොටගම පුස්තකාලයේ හා මූදියල පෙර පාසලේ** ලෙස ඇතුළත් වීම.